# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2450/27 - 2025 අගෝස්තු මස 20 වැනි බදාදා - 2025.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපති විධානය

මුද්‍රාව

අනුර කුමාර දිසානායක

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කටයුතු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපිත කිරීම.

1. ගරු විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍ය
2. ගරු සංචාරක නියෝජ්‍ය අමාත්‍ය
3. ජනාධිපති ලේකම්
4. ලේකම්, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
6. ලේකම්, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
7. ලේකම්, පරිසර අමාත්‍යාංශය
8. ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, පශුසම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශය
9. ලේකම්, ප්‍රවාහන, මහා මාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
10. අතිරේක ලේකම් (සංවර්ධන), සංචාරක අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
11. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
12. සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
13. සභාපති, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය
14. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල

15. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
16. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
17. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී දෙපාර්තමේන්තුව
18. අධ්‍යක්ෂ ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
19. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
20. ආගමන විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
21. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය
22. පොලිස්පති, පොලිස් දෙපාර්තමේන්තුව
23. දුමින්ද හුලංගමුව මැතිතුමා
24. ක්‍රිෂාන් බාලේන්ද්‍ර මැතිතුමා
25. නිහාල් මුහන්දිරම් මැතිතුමා
26. නලින් ජයසුන්දර මැතිතුමා
27. සුරන්ජිත් වැව්ට මැතිතුමා
28. ශිරෝමාල් කුරේ මැතිතුමිය

වෙත,
ශුභාශිංසන පූර්වකවයි!

රාජ්‍ය අංශයේ ආයතන සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව සංවිධාන සංචාරක ව්‍යාපාරය උත්ශ්‍රේනිගත කිරීමේ දී ප්‍රධාන උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කරන හෙයින් පවතින ආයතන නිසි ලෙස සම්බන්ධීකරණය සහ අංශයේ වේගවත් පරිවර්තනයක් උත්ප්‍රේරණය කිරීම සඳහා රජයත්, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමෙන් කැපවූ, බලගැන්වූ යාන්ත්‍රණයක් සහ විශේෂ වැඩපිළිවෙලක අවශ්‍යතාවය රජය විසින් හඳුනා ගෙන ඇති හෙයින්ද,

පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව "නව්‍ය සංචාරක කර්මාන්තයක් ආකර්ශනීය ගමනාන්තයක්" යටතේ පොහොසත් රටක් නිර්මාණය කිරීමේ දී සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය සඳහා ඒ ආශ්‍රිතව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් මඟින් මහජනතාවගේ අභිලාෂ සහ අපේක්ෂා කඩිනමින් ළඟා කරදීමේ අවශ්‍යතාවය වර්තමාන රජයේ ප්‍රමුඛ අවධානයට ලක්ව ඇති හෙයින්ද,

වඩාත් පහසු හා කඩිනමින් විදේශ විනිමය ඉපැයීමේ හැකියාව ඇති සංචාරක කර්මාන්තයේ වර්ධනය වෙනුවෙන් උපාය මාර්ගික වැඩපිළිවෙලක් නිවැරදි ආකාරයෙන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය රජය විසින් හඳුනා ගෙන ඇති හෙයින්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කටයුතු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය මෙයින් ස්ථාපිත කරනු ලබන අතර, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය හා පක්ෂපාතීත්වය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. ගරු විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍ය
2. ගරු සංචාරක නියෝජ්‍ය අමාත්‍ය
3. ජනාධිපති ලේකම්
4. ලේකම්, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
6. ලේකම්, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
7. ලේකම්, පරිසර අමාත්‍යාංශය
8. ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, පශුසම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශය
9. ලේකම්, ප්‍රවාහන, මහා මාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
10. අතිරේක ලේකම් (සංවර්ධන), සංචාරක අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
11. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
12. සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
13. සභාපති, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය
14. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල

15. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
16. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
17. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී දෙපාර්තමේන්තුව
18. අධ්‍යක්ෂ ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
19. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
20. ආගමන විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
21. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය
22. පොලිස්පති, පොලිස් දෙපාර්තමේන්තුව
23. දුමින්ද හුලංගමුව මැතිතුමා
24. ක්‍රිෂාන් බාලේන්ද්‍ර මැතිතුමා
25. නිහාල් මුහන්දිරම් මැතිතුමා
26. නලින් ජයසුන්දර මැතිතුමා
27. සුරන්ජිත් වැව්ට මැතිතුමා
28. ශිරෝමාල් කුරේ මැතිතුමිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ අනෙකුත් ලිඛිත නීතිවල සඳහන් ප්‍රතිපාදනයන්ට යටත්ව, මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත කී ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයන් ලෙස පත් කරමි.

එකී කාර්යයන් කවරේ ද යත්;

**1. ප්‍රතිපත්ති විශ්ලේෂණය, උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම සහ නියාමනය**

i. විශේෂිත විශේෂඥතාව අවශ්‍ය වන නිශ්චිත ප්‍රතිපත්ති ගැටලු පිළිබඳ ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ නිර්දේශ ලබා දීම. සංචාරක ක්ෂේත්‍රයේ විශේෂඥයින් සමග සාකච්ඡා කිරීමෙන් සහ පවතින තත්ත්වය මත සංචාරක ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සංස්කෘතික උරුමයන් සහ පාරිසරික සංරක්ෂණය සහතික කිරීම සඳහා උපායමාර්ගික රාමුවක් හඳුනා ගැනීම සහ අදාළ ආයතන සඳහා එම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම් ලබා දීම
ii. සංචාරක පස් (05) අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ ජාතික, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය ආයතන සහ පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණයෙන් ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා ඉහළ මට්ටමේ ජාතික මැදිහත්වීම සිදු කිරීම
iii. ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ සැලසුම්, පෞද්ගලික අංශය ඇතුළු විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීම
iv. නායකත්ව/තීරණ ගැනීමේ මට්ටම්වල රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සහිත ආයතන, රාජ්‍ය ප්‍රතිපත්ති, ඉදිරි දර්ශන, රාජ්‍ය වගවීම සහ අභිප්‍රේරණ සහිත සංචාරක ව්‍යාපාරයට කැපවූ මානව සම්පත් සංවර්ධනය
v. සංචාරක අංශයේ අධ්‍යයනයන් සහ ඒ හා සමාන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා මග පෙන්වීම
vi. ඵලදායී සංචාරක අංශ නියාමනය සහ සියලුම අවිධිමත් හවුල්කරුවන් විධිමත් කිරීම

**2. අභියෝග හඳුනා ගැනීම සහ විසඳුම් යෝජනා කිරීම**

i. අංශයේ අභියෝග සහ අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමට බලගන්වන ලද ආයතනික යාන්ත්‍රණය සම්බන්ධීකරණය
ii. මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදනය, මානව සම්පත් කළමනාකරණය සඳහා ක්‍රියාවලීන් සහ පද්ධති සැකසීම
iii. ආයතනික මෙහෙයුම් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සැපයීම, මෘදුකාංග පද්ධති වෙබ් පැවැත්ම සහතික කිරීමට කඩිනම්ව තාක්ෂණය සක්‍රිය/ස්වයංක්‍රිය, සරල සහ විනිවිද පෙනෙන පද්ධති ස්ථාපනය
iv. අදාළ සංචාරක ගමනාන්තවල සේවා, සත්කාරක තොරතුරු සඳහා පහසුවෙන් ළඟා වීමට, අන්තර්ජාල සහ යටිතල පහසුකම් ස්ථාපනය, නඩත්තුව සහ අදාළ කාර්යයන් ඉටු කිරීම
v. සංචාරකයින් ආරක්ෂා කිරීම සහ සංචාරකයින් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් මුදල් ගෙවා ප්‍රතිකාර ලැබිය හැකි වාට්ටු සහිත හඳුනාගත් රෝහල් වැඩිදියුණු කිරීම.
vi. සමස්ත ව්‍යුහය තවදුරටත් සරල කළ යුතු අවස්ථා, ආයතන අතර වගකීම්වල ඇති ඕනෑම අතිච්ඡේදනයක් (overlapping) ආමන්ත්‍රණය කර විසඳාලීම
vii. ආයතන අතර සහයෝගීතාවය සඳහා හොඳින් ස්ථාපිත යාන්ත්‍රණ සහිතව, ක්‍රියාකාරීව ස්වාධීනව, ආයතන අතර පැහැදිලිව අර්ථ දක්වා ඇති භූමිකාවන් සහ වගකීම් ඉටු කිරීම

viii. සංචාරක ආයතනවල ඔවුන්ට ලැබෙන අරමුදල්වලට අමතරව සම්පත් බලමුලු ගැන්වීම

ix. රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන අංශ සහ හවුල්කරුවන් සම්බන්ධීකරණය

x. මානව සම්පත් පුහුණු කිරීමේ කටයුතු සහ සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට මඟ පෙන්වීම

xi. නව්‍ය සංචාරක නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා සමස්තයක් වශයෙන් දිගුකාලීන ආර්ථික වර්ධනයක් සහ යහපැවැත්මක් අනුගමනය කරන ආර්ථික වර්ධනයට ඇතුළත් නව්‍ය සංචාරක නිෂ්පාදන සංවර්ධනය කිරීමට කටයුතු කිරීම (Inclusive economic growth/innovative tourism product development)

xii. අවිධිමත් සංචාරක සේවා සපයන්නන් විධිමත් අංශයට අවශෝෂණය කර ගැනීමට සියලුම සංචාරක ආයතනවල ප්‍රමිතීන් සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අවිධිමත් සංචාරක සේවා සපයන්නන් විධිමත් අංශයට අවශෝෂණය කර ගැනීම සඳහා සංචාරක සත්කාරක හා සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම

xiii. ඒ සඳහා අවශ්‍ය පද්ධති සංවර්ධනය කිරීම මෙන්ම සංචාරක කර්මාන්තයේ වාණිජ ඩිජිටල් වේදිකා සහ යෙදුම් බලපත්‍ර ලබා දීම සඳහා නියාමන රාමුවක් සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන්ට අනුකූලව මෙහෙයුම් සිදු කිරීම සහතික කිරීම. (license commercial digital platforms and Apps in tourism industry, it will enable collection of TDL from such commercial platforms.)

xiv. සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය හා ප්‍රගමනය සඳහා අවශ්‍යවේයැයි කමිටුව තීරණය කරනු ලබන ඕනෑම කාරණයක් සම්බන්ධව මැදිහත්ව කටයුතු කිරීම

**3. අධීක්ෂණය සහ ඇගයීම**

i. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය ඇතුළත්ව සංචාරක අංශයේ සියලුම ආයතන සහ ඔවුන්ගේ දිගුකාලීන උපායමාර්ගික සැලසුම් සමඟ පෙළගස්වා ඇති ඔවුන්ගේ වාර්ෂික සැලසුම්වල ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට කැපවී සිටීම සහතික කිරීම සහ සුදුසු අධීක්ෂණය මඟින් නිවැරදි දිශානතියකට යොමු කිරීම මඟින් සංචාරක අංශයේ සංවර්ධනය, නියාමනය, සන්නාමකරණය, මානව සම්පත් සංවර්ධනය සහ එහි අරමුණු වෙනුවෙන් කරනු ලබන අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට තවදුරටත් ශක්තිමත් වූ අන්තර් රාජ්‍ය යාන්ත්‍රණයක සහාය ලබා දීම සහ ඒ පිළිබඳ අධීක්ෂණය

ii. සත්කාරක සේවා සහ සංචාරක නිකේතන ලියාපදිංචිය සම්බන්ධයෙන් සංචාරක සේවා සපයන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජංගම සේවාවන් පැවැත්වීම අධීක්ෂණය

**4. ප්‍රාදේශීය මට්ටම දක්වා පුළුල් කිරීම**

i. නිශ්චිත සාමාජිකයින්, නිශ්චිත යොමු නියමයන් සහ කාල රාමුවක් සහිත නිශ්චිත කමිටු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමෙන් ස්ථාපිත කිරීම. මෙම කමිටු සඳහා රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ නියෝජනය සහතික කිරීම

ii. සංචාරක ව්‍යාපාරයට සෘජුවම අදාළ වර්තමානයේ පවතින ක්‍රමවේදයන්හි අඩුපාඩු හඳුනා ගැනීම සහ ඒ සඳහා පිළියම් යෙදීම පිණිස පවතින සැපයුම්දාම විශ්ලේෂණය කර උපදෙස් ලබා දීම

iii. රජයේ ආයතන අතර මෙන්ම රජයේ විවිධ මට්ටම් හරහා (මධ්‍යම/ පළාත්/ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය) සහයෝගීතාවය, අන්තර් ආයතනික සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම

**5. ආකර්ශනීය ගමනාන්ත සඳහා පහසුකම් පුළුල් කිරීම**

i. සියලුම අමුත්තන්ට බාධාවකින් තොරව, ආකර්ශනීය සහ ආරක්ෂිත වටපිටාවක් සහතික කරමින්, විනෝදාශ්වාදය වැඩි දියුණු කරමින්, අපට උරුම ආගන්තුක සත්කාර කළමනාකරණයේ හොඳම පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් ආගන්තුක අත්දැකීම් ආකෘතියක් (visitor experience model) සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ii. ආකර්ශනීය ගමනාන්තයක් සහතික කරලීම සඳහා කළමනාකරණය සහ සම්බන්ධතා ජාලයන් ගොඩ නැංවීම (Destination management and connectivity)

iii. සංචාරක ගමනාන්ත තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ අතර සහයෝගීතාවයෙන් කටයුතු කරමින් ගමනාන්ත හඳුනා ගැනීම, කළමනාකරණය, අලෙවිකරණ උපාය මාර්ග මෙන්ම සෘණාත්මක බලපෑම් අවම කර උපරිම ප්‍රතිලාභ අරමුණු කර කටයුතු කිරීම

iv. මූලික යටිතල පහසුකම් පුළුල් කිරීම, ගමනාන්ත මට්ටමින් පහසුකම් සංවර්ධනය සහ සක්‍රිය කිරීම සහ බාධාවකින් තොරව දිගු දුර ප්‍රවාහන සම්බන්ධතාවයන් සක්‍රිය කිරීම, පෞද්ගලික අංශයේ ව්‍යාපෘතිවල විශාල ආයෝජන සමාලෝචනය, නවාතැන් දේපළ සහ සංචාරක සැපයුම් දාමය හරහා තිරසාරභාවය ඇති කිරීම

v. සංචාරක ප්‍රධාන නගර සැලසුම් සංවර්ධනය කිරීම (නුවරඑළිය, හික්කඩුව, මීගමුව, කල්පිටිය)

vi. සමුද්‍ර සංචාරක මාර්ග සිතියම සහ උපායමාර්ගික සැලැස්ම දියත් කිරීම (Marine Tourism Roadmap & Strategic Plan)

**6. තිරසාර සංචාරක සංවර්ධනය**

i. සීගිරිය මෙන්ම අනෙකුත් සංචාරක කලාපවල ජාත්‍යන්තර ප්‍රමිති සංඥා සහ සංකේත ක්‍රියාත්මක කිරීම මෙන්ම සහතික කරන ලද ගමනාන්ත ලෙස අන්තර්ජාතික ප්‍රමිතිකරණ ලබා ගැනීම

**7. සංචාරක ප්‍රවර්ධනය, අලෙවිකරණය සහ සන්නාමකරණය**

i. ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධනය, අලෙවිකරණය සහ සන්නාමකරණය ඉහළ නැංවීම සඳහා මාර්ගගත සංචාරක ආයතන (OTA) සමඟ උපායමාර්ගික සම්බන්ධතා ඔස්සේ කටයුතු කිරීම (Strategic Engagement with Online Travel Agencies (OTAs) to boost Sri Lanka's Visibility)

ii. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ තානාපති කාර්යාල සමඟ සංචාරක ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම

iii. සංචාරක නිෂ්පාදන සහ සැපයුම් දාම වැඩිදියුණු කිරීම්

iv. නව වෙළඳපළ සහ සංචාරක පිරිස් ගෙන්වා ගැනීම සඳහා සංචාරක සන්නාම ප්‍රවර්ධන

v. සංචාරක ආයතන සියලු වෙළඳපළ ඉලක්ක මත ඵලදායී ලෙස තරග කිරීමට සන්නද්ධ කරවීම

vi. ගෝලීය සංචාරක සංවිධාන සමඟ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීම

තවද, ඉහත කී කාර්ය සාධක බලකායේ සභාපති වශයෙන් ගරු විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යතුමා ද, උප සභාපති වශයෙන් ගරු සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා ද, පත් කරමි.

තවද, ඉහත කී කාර්ය සාධක බලකායේ ලේකම් වශයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශයේ ලේකම් පත් කරමි.

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ අනෙකුත් ලිඛිත නීතිවල සඳහන් ප්‍රතිපාදනයන්ට යටත්ව, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට ද, ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් අදහස් කරනු ලබන රජයේ නිලධරයන්ගේ සහාය ලබා ගැනීමට ද, ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයන් වන ඔබ වෙත මෙයින් බලය පවරමි.

තවද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පූර්වෝක්ත කාර්ය සාධක බලකාය විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පූර්වෝක්ත කාර්ය සාධක බලකායට මෙයින් නියම කොට විධානය කරමි.

තවද, එකී ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන ඔබ විසින්, ඉහත කාර්යයන් ඉටු කිරීම පිළිබඳව කලින් කලට මා වෙත වාර්තා ඉදිරිපත් කරන ලෙස ද මෙයින් දන්වමි.

තවද, පෙරකී කාර්ය සාධක බලකාය විසින් වසර දෙකක (02) කාලයක් තුළ ඉහත කී නියෝගවලට අදාළ රාජකාරී ඉටු කර අදාළ වාර්තාව ඉදිරිපත් කළයුතු බව ද මෙයින් දන්වමි.

වර්ෂ දෙදහස් විසි පහක් වූ අගෝස්තු මස 19 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදි.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ආචාර්ය එන්.එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

EOG 08 - 0222

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.